අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය - උතුරු පර්ෂදය
අංක 31, නුවර පාර
දළුගම
කැලණිය

බීඑෆ්/එන්පීඑෆ්/02 (58)

අධ්‍යක්ෂ කෘෂිකර්ම හා පශුසම්පත්
කාරුණික අවධානය සඳහා

2016 පෙබරවාරි 15

**යුද්ධ හමුදා ගොවිපල වෙතින් උපයන ලාභ ප්‍රතිශතයක් රජයේ ඒකාබද්ධ අරමුදල/යුහ සුභසාධක අරමුදල වෙත බැරකිරීම**

යොමුව:

අ. FIN/06/01/34 හා 2015.07.10 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය.

ආ. අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ විසින් යුද්ධ හමුදාධිපති වෙත ඉදිරිපත්කර ඇති 2016.01.08 දිනැති කාර්යාල සටහන.

1. යුද්ධ හමුදාවේ ගොවිපල වෙතින් උපයන ආදායම් ප්‍රතිශතයක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත බැරකරන ලෙස යොමුව "අ" දරණ ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය මගින් උපදෙස් ලබාදී ඇති අතර එම බැරකරන මුදල් ප්‍රමාණයට අනුරූපව එක් එක් ව්‍යාපෘතින් සඳහා අවැසි අරමුදල් වෙනුවෙන් 2016 වර්ෂයේ රු. මි. 400 ක ප්‍රතිපාදන රාජ්‍ය අයවැය තුලින් යුද්ධ හමුදාව වෙත දැනටමත් වෙන්කරදී ඇත.

2. ඒ අනුව යුද්ධ හමුදාවේ දැනට ක්‍රියාත්මක යුහ ගොවිපල 06 වෙතින් මෙ දක්වා ලද ආදායමින් රජයේ ඒකාබද්ධ අරමුදලට හා යුහ සුභසාධක අරමුදලට පහත සඳහන් පරිදි මුදල් බැරකිරීමට යොමුගත "ආ" දරණ කාර්යාල සටහනේ යුද්ධ හමුදාධිපති විසින් තබා ඇති සටහන මගින් අනුමැතිය ලබාදී තිබේ.

අ. 2009 වසරේ සිට 2015 තුන්වන කාර්තුව දක්වා යුහ ගොවිපල වෙතින් ලැබූ රු. 76,698,826.93 ලාභයෙන් (16,177,336.94 + 60,521,489.99) 15% ක් එනම් රු. 11,504,824.04 ක මුදලින් 40% ක මුදලක් (රු. 4,601,929.62) රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකිරීම සඳහා යුද්ධ හමුදාධිපති නමින් ලියනලද ප්‍රේෂණපත්‍රක් අධ්‍යක්ෂ මුදල්අම වෙත 2016.02.20 දිනට ප්‍රථම භාරදී මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට අච්අමට පිටපත් සහිතව සනාථ කිරීම.

ආ. 2015 වර්ෂයේ අවසන් කාර්තුවේ සිට මින් ඉදිරියට යුද්ධ හමුදා ගොවිපල වෙතින් ලබන ලාභයෙන් 85% ක ප්‍රතිශතයක් කාර්තුමය වශයෙන් යුහ ගොවිපල ගිණුමේ රඳවා තබාගැනීමට හා ඉතිරි 15% ක ප්‍රතිශතය පහත සඳහන් පරිදි ඒ ඒ අරමුදල් වෙත බැරකිරීමට කටයුතු කිරීම.

(1) රජයේ ඒකාබද්ධ අරමුදල වෙත 40 %

(2) යුහ සුභසාධක අරමුදල වෙත 45 %

(3) යුහ ගොවිපල යටතේ රාජකාරීන්හි නිරත සෙබලුන් දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ සුභසාධනය සඳහා යෙදවීමට ඔවුන් අයත් ඒකක වෙත 15 % ක ප්‍රතිශතයක් ලබාදීම.

උදාහරණ:-

| | | |
|---|---|---|
| (අ) කාර්තුවක් සඳහා යුහ ගොවිපල 06 වෙතින් ලද ලාභය | රු: | **5,000,000.00** |
| (ආ) එම මුදලින් 15% ක මුදල | රු: | **750,000.00** |
| i. එයින් 40% ක් රජයේ ඒකාබද්ධ අරමුදල වෙත | රු: | 300,000.00 |
| ii. 45% ප්‍රතිශතයක් යුහ සුභසාධක අරමුදල වෙත | රු: | 337,500.00 |
| iii. 15% ප්‍රතිශතයක් ගොවිපල රාජකාරි නියුතු සෙබලුන් දිරිගැන්වීම සඳහා ඔවුන් අයත් ඒකක වෙත | රු: | 112,500.00 |
| **එකතුව** | රු: | **750,000.00** |
| (ඇ) ඒ අනුව යුහ ගොවිපල ගිණුම වෙත ඉතිරිවන මුදල (ගොවිපල මුළු ලාභයෙන් 85%) | රු: | **4,250.000.00** |

ඇ. 2015 අවසන් කාර්තුවේ සිට ඉදිරියට ඉහත උදාහරණයේ දක්වා ඇති ක්‍රමවේදය අනුව ගණනය කර ඉහත 2 'ආ' උපජේදයේ දක්වා ඇති ප්‍රතිශතයට අදාල මුදල වෙනුවෙන් සෑම කාර්තුවක් අවසානයේ ඊළඟ කාර්තුවේ පළමු මාසය අවසානයට ප්‍රථම පහත දක්වා ඇති පරිදි ක්‍රියාකල යුතුය.

(1) රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකරනු ලබන මුදල වෙනුවෙන්වූ ප්‍රේෂණපත "යුද්ධ හමුදාධිපති" නමින් ලියා මෙම අමට පිටපත් සහිත ආවරණ ලිපියක් මගින් මුදල්අම වෙත භාරදීමට ක්‍රියාකිරීම.

(2) යුහ සුභසාධක අරමුදලට බැරකරනු ලබන මුදල වෙනුවෙන්වූ ප්‍රේෂණපත එම අරමුදල නමින් ලියා මෙම අමට පිටපත් සහිතව ආවරණ ලිපියක් මගින් හලේකා වෙත භාරදීමට ක්‍රියාකිරීම.

3. මෙම ලිපිය ලද බව හා ඉහත සඳහන් උපදෙස් අනුව ක්‍රියාකරන බව සනාථ කිරීමට කටයුතුකරන මෙන් කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

ආර් ඩී උඩවත්ත පීඑස්සී එට්ඩ
මේජර් ජෙනරල්
අධ්‍යක්ෂ ජෙනරල් මූල්‍ය කළමනාකරණ

පිටපත්:

හලේකා
මුකගා
අවිඅම
රෙමඩ්‍රිලයුපොදුසේබ } දැනගැනීම සඳහා